# Abstract 28

## භික්ෂුව හා අද්‍යතන සමාජ අභියෝග

**පූජ්‍ය. හසලක සීලවිමල හිමි,** (ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ දර්ශනය),
**පූජ්‍ය. බෙරලිහෙල සරණකිත්ති හිමි,** (ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර),
*seelawimalah@gmail.com, bsaranakitti91@gmail.com*

භික්ෂුව යනු නිර්වාණ මූලික ප්‍රතිපදාවක් විෂයයෙහි තම ජීවිතය කැප කළ පරමාදර්ශී පුද්ගල චරිතයක් වේ. බුදුන් වහන්සේගේ නිර්දේශය අනුව මෙම භික්ෂුව සතු ප්‍රධාන කාර්යභාරයන් දෙකකි. 1. නිර්වාණ මූලික ප්‍රතිපදාවක යෙදීම 2. සමාජ ශුභ සාධනය උදෙසා කැපවීම යනුවෙනි. මෙම පරමාදර්ශයන් දෙක අරමුණු කොට ක්‍රියාත්මක වන පැවිද්ද අතිශය දුෂ්කර බව බුදුන් වහන්සේ විසින් ම දක්වා ඇත. මෙම වගකීම් ඉෂ්ට කිරීම සඳහා ක්‍රියාත්මක වීමේ දී ඇති වූ සහ ඇතිවිය හැකි සංසිද්ධීන් කෙරෙහි ද බෞද්ධ මූලාශ්‍රය අවධානය යොමු කොට තිබීම වැදගත් කරුණකි. වර්තමානය තරම් ව්‍යාකූල නොවූ මුල් බුදුසමයාගත පැවිද්ද නිදහස් වූවකි. (අබ්භොකාසොව පබ්බජ්ජා) එහෙත් කාලීන, දේශීය හා ආර්ථික, දේශපාලනාදී සංසිද්ධීන්හි බලපෑම් හේතුවෙන් සිදුවී ඇති සංස්කෘතික විපර්යාසයන් රාශියක් හමුවේ නූතන භික්ෂුවගේ කාර්යභාරය අතිශය සංකීර්ණ ස්වරූපයක් ගනී. මේ නිසා පොදු සමාජ ව්‍යුහය තුළ නූතන භික්ෂු චර්යාවේ සුභාවිතයන් හා අවභාවිතයන් සම්බන්ධයෙන් විවිධ ස්වරූපයේ කතිකාවන් පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ආදියෙහි මෙන් ම අනෙකුත් විවිධ සන්දර්භවල සිදුවෙමින් පවතී. මෙම කතිකා විවිධ දෘෂ්ටිගතවීම්, උපායික හේතු ආදී අනේකවිධ හේතු නිසා හුදු සාකච්ඡා මිස එලෝත්පාදක ක්‍රියාවලීන් වී නැත. භික්ෂුවගේ අරමුණට කාල, දේශ, කුල, ගෝත්‍රාදී මර්යාදාවන් නැත. ඒ පිළිබඳව කෙරෙන කතිකාවන් බෞද්ධ දාර්ශනික නියමයන් සහ සංස්කෘතික චරණ පිළිබඳ මූලික අවබෝධයෙන් කළ යුතු ඒවා වේ. මෙම කතිකාව මූලික වශයෙන් සිදුවිය යුත්තේ පුද්ගල කේන්ද්‍රීයව ය (දසධම්ම සූත්‍රය). දෙවනුව එය සිදුවිය යුත්තේ පොදු සංඝ සංස්ථාව තුළ ය (සංගීති සූත්‍රය). මෙම පර්යේෂණයේ දී සලකා බැලෙනුයේ නූතන භික්ෂුවට තම සීමාවේ සිට වර්තමාන සමාජ අභියෝග විෂයයෙහි පිළියම් යෙදිය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව ය.

**ප්‍රමුඛ පද :** අභියෝග, නිර්වාණය, නූතන සමාජය, භික්ෂුව, ශාසනය